8 ශ්‍රේණිය

09 - මානව ඉන්ද්‍රිය පද්ධති

විද්‍යාව



සැකසුම:
එල්.ගාමිණී ජයසූරිය මයා
ගුරු උපදේශක(විද්‍යාව)
වෙන්/කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය
ලුණුවිල

Smart Learning For Students by Chilaw Education Zone

මූත්‍ර වාහිනී පද්ධතිය



01. සියලු ජීවීන්ගේ ජීවය පවතින්නේ සෛල තුළ සිදුවන රසායනික ප්‍රතික්‍රියා මගින් සිරුරට අවශ්‍ය ද්‍රව්‍ය නිපදවා ගැනීම නිසා ය. අවශ්‍ය ද්‍රව්‍ය නිපදවා ගැනීමට සිදුකරන රසායනික ප්‍රතික්‍රියාවේ දී ඵල ලෙස ප්‍රයෝජනවත් ද්‍රව්‍ය මෙන්ම නිෂ්ප්‍රයෝජන ද්‍රව්‍ය ද නිපදවිය හැකි ය.

i. ශක්තිය නිපදවීම සඳහා ශ්වසන ක්‍රියාවලියේ දී සෛල තුළ ග්ලූකෝස් ඔක්සිජන් සමග ප්‍රතික්‍රියා කරයි.

a. ශ්වසන ක්‍රියාවලියේදී නිපදවෙන ප්‍රයෝජනවත් දෑ මොනවා ද?

- ශක්තිය

b. ශ්වසන ක්‍රියාවලියේදී නිපදවෙන ප්‍රයෝජනවත් නොවන දෑ මොනවා ද?

- කාබන් ඩයොක්සයිඩ් සහ ජලය

ii. බහිස්‍රාවය ලෙස හඳුන්වන්නේ කුමක් ද?

- ජීවී සෛල තුළ සිදු වන රසායනික ප්‍රතික්‍රියා මගින් නිපදවෙන නිෂ්ප්‍රයෝජන ද්‍රව්‍ය සිරුරෙන් බැහැර කිරීමේ ක්‍රියාවලිය බහිස්‍රාවය ලෙස හැඳින්වේ

iii. සජීවී සෛල තුළ සිදුවන රසායනික ප්‍රතික්‍රියාවල ඵල ලෙස නිපදවෙන නිෂ්ප්‍රයෝජන ද්‍රව්‍ය බහිස්‍රාවීය ද්‍රව්‍ය ලෙස හැඳින්වේ. මිනිස් සිරුරෙහි නිපදවෙන බහිස්‍රාවීය ඵල පහක් සඳහන් කරන්න.

- කාබන් ඩයොක්සයිඩ්
- ජලය
- යූරියා
- යූරික් අම්ලය
- ලවණ වර්ග

iv. මල ද්‍රව්‍ය බහිස්‍රාවීය ද්‍රව්‍ය ලෙස නොසැලකේ. ඊට හේතුව කුමක් ද?

- මල ද්‍රව්‍ය නිෂ්ප්‍රයෝජන ද්‍රව්‍ය වුවද ඒවා සිරුර තුළ සිදුවන රසායනික ප්‍රතික්‍රියාවකින් නිපදවෙන ද්‍රව්‍යය නොවීම.

iv. මානව දේහයේ බහිස්‍රාවීය ඵල බැහැර කිරීමට අදාළ ව පහත වගුව සම්පූර්ණ කරන්න.

බහිස්‍රාවීය ඉන්ද්‍රිය	බහිස්‍රාවී ද්‍රව්‍ය හඳුන්වන නම	බහිස්‍රාවී ඵල
පෙනහැල්ල	ප්‍රශ්වාස වාතය	කාබන් ඩයොක්සයිඩ් ජලය
වෘක්ක	මූත්‍ර	යූරියා, යූරික් අම්ලය, ජලය හා ලවණ
සම	දහදිය	යූරියා, යූරික් අම්ලය, ජලය හා ලවණ

02. මිනිසාගේ නයිට්‍රජනීය බහිස්‍රාවීය ද්‍රව්‍ය බැහැර කෙරෙන පද්ධතිය මූත්‍ර පද්ධතිය යි. මානව මූත්‍ර පද්ධතිය සිරුරෙහි පිහිටා ඇති ආකාරය රූපයේ දැක්වේ.



i. 1,2,3 හා 4 අංක මගින් නිරූපණය කරන මූත්‍ර පද්ධතියට අයත් ප්‍රධාන කොටස් නම් කරන්න.

1. වෘක්කය
2. මූත්‍ර වාහිනිය
3. මූත්‍රාශය
4. මූත්‍ර මාර්ගය



ii. පහත අක්ෂර මගින් නිරූපණය කර ඇති රුධිර වාහිනී නම් කරන්න.

A . අධර මහා ශිරාව

B . සංස්ථානික මහා ධමනිය

C. වෘක්කීය ධමනිය

D. වෘක්කීය ශිරාව



iii. වෘක්කයට රුධිරය සපයන නාළයත්, වෘක්කවල සිට රුධිරය ඉවතට ගෙන යන නාළයත් පිළිවෙලින් සඳහන් කරන්න.

A . අධර මහා ශිරාව

B . සංස්ථානික මහා ධමනිය

C. වෘක්කීය ධමනිය

D. වෘක්කීය ශිරාව



03. මූත්‍ර පෙරීම සිදුවන්නේ වෘක්කය තුළය. වෘක්කයෙහි අභ්‍යන්තර ව්‍යුහය රූපයේ දැක්වේ.

i. මූත්‍රවල අඩංගු ප්‍රධාන සංඝටක හතරක් සඳහන් කරන්න.



- ජලය
- යූරියා
- යූරික් අම්ලය
- ලවණ වර්ග (සෝඩියම් ක්ලෝරයිඩ් වැනි)

ii. වෘක්කයෙහි අභ්‍යන්තර ව්‍යුහය සම්බන්ධයෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

තොරතුර	අදාළ ව්‍යුහය	රූපයේ නම් කර ඇති අක්ෂරය
රුධිර කේශනාලිකා බහුල බැවින් තද පැහැයක් ගනී.	වෘක්ක බාහිකය	A
කේතු ආකාර වෘක්ක පිරමිඩ නම් ව්‍යුහ ඇත.	වෘක්ක මජ්ජාව	B
වෘක්ක පිරමිඩවල තුඩු මෙම කුහරයට යොමු වී ඇත.	ශ්‍රෝණිය	C
වෘක්කවලට රුධිරය ගෙන එයි.	වෘක්කීය ධමනිය	D



iii. විවිධ හේතු නිසා වෘක්ක ආශ්‍රිතව රෝගාබාධ ඇතිවේ. පහත රෝග ඇතිවීමට හේතු තුන බැගින් සඳහන් කරන්න.

a. මූත්‍රා ගල් ඇති වීම.

- ප්‍රමාණවත් පරිදි ජලය පානය නොකිරීම
- අධික ලවණ සහිත ආහාර නිරතුරුවම ගැනීම
- අවශ්‍යතාවය අනුව මූත්‍ර බැහැර කිරීම ප්‍රමාද කිරීම.

b . වෘක්ක අකර්මණ්‍ය වීම.

- බැර ලෝහ සහ විෂ රසායන ද්‍රව්‍ය ශරීර ගත වීම.
- දිගු කාලයක් දියවැඩියා රෝගයෙන් පෙළීම.
- ඇතැම් ඖෂධ දිගු කාලයක් භාවිත කිරීම.
- දුම් පානය කිරීම සහ මත්පැන් පානය කිරීම.

c . වෘක්ක ආසාදනය වීම.

- ක්ෂුද්‍ර ජීවීන් මගින් මූත්‍ර මාර්ගයේ ආසාදන ඇතිකිරීම.
- මූත්‍ර මාර්ගය ආශ්‍රිතව අපිරිසිදු බව
- අපිරිසිදු යට ඇඳුම් භාවිතය

iv . වෘක්ක ආශ්‍රිතව ඇති විය හැකි රෝගවලින් ආරක්ෂා වීමට ඔබට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග පහක් ලියන්න.

- ප්‍රමාණවත් පිරිසිදු ජලය පානය කිරීම
- පිරිසිදු යට ඇඳුම් භාවිතය
- දුම් පානයෙන් හා මත්පැන් පානයෙන් වැළකීම.
- අම්ල,ලවණ සහිත ආහාර භාවිතය සීමා කිරීම
- වෛද්‍ය උපදෙස් මත ඖෂධ භාවිත කිරීම.

v . රූපයේ දැක්වෙන උපකරණ භාවිත කරනු ලබන්නේ කුමන කාර්යයක් සඳහා ද ? එම උපකරණය හඳුන්වන නම කුමක් ද?

- ලිතෝට්‍රිප්සි යන්ත්‍රය

මානව ස්නායු පද්ධතිය

03. මිනිසාගේ ශරීර අභ්‍යන්තරයේ මෙන්ම බාහිර පරිසරයේ ද නිරන්තර වෙනස්වීම්වලට ලක්වේ. එම වෙනස්වීම් බොහොමයක් අපට දැනෙයි. අප එම වෙනස්වීම්වලට ප්‍රතික්‍රියා දක්වන්නෙමු.

i. පරිසරයේ සිදුවන වෙනස්වීම් අපට දැනෙන සංවේදී ඉන්ද්‍රිය හෙවත් ප්‍රතිග්‍රාහක පහ සඳහන් කරන්න.

- ඇස
- කන
- නාසය
- දිව
- සම

ii. බාහිර පරිසරයේ සිදුවූ වෙනස්වීම් හඳුනා ගැනීමෙන් පසු ඔබ ඒවාට ප්‍රතික්‍රියා හෙවත් ප්‍රතිචාර දැක්වූ අවස්ථා පහක් ලියන්න.

a. ....
b. ....
c. ....
d. ....
e. ....

iii. ප්‍රතිග්‍රාහක මගින් ලබා ගන්නා සංවේදන වලට දක්වන ප්‍රතිචාර බොහොමයක් වන්නේ සිරුරේ සිදුකරන චලනයන් ය. චලන සිදු කිරීමට දායක වන සිරුරු කොටස් කෙසේ හඳුන්වනු ලබයි ද?

- පේශි

iv. ප්‍රතිචාරය චලනයක් නොවන අවස්ථාවක් සඳහන් කරන්න.

- ඛේටය ශ්‍රාවය වීම/ කඳුලු ගැලීම/දහදිය දැමීම

v. ප්‍රතිචාරය චලනයක් නොවන විට ඊට ප්‍රතිචාර දක්වන්නේ සිරුරේ කුමන කොටසක් ද?

- ග්‍රන්ථි

vi. සංවේදනවලට ප්‍රතිචාර දක්වන සිරුරු කොටස් පොදුවේ හඳුන්වන නම කුමක් ද?

- කාරක

vii. සමායෝජනය යන්නෙන් අදහස් වන දෑ සරලව දක්වන්න.

- උත්තේජයකට ප්‍රතිචාර දැක්වීම සඳහා ප්‍රතිග්‍රාහක, ඉන්ද්‍රිය පද්ධති මනා සම්බන්ධීකරණයකින් යුතුව ක්‍රියා කිරීම.

viii. මිනිස් සිරුරේ සමායෝජනය සිදුකෙරෙන ආකාර දෙක සඳහන් කරන්න.

a. ස්නායුක සමායෝජනය

b. රසායනික සමායෝජනය

04. ස්නායුක සමායෝජනය සිදුවන්නේ ස්නායු පද්ධතිය මගිනි.

i. ස්නායු පද්ධතිය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකිය එම කොටස් දෙක නම් කරන්න.

- මධ්‍ය ස්නායු පද්ධතිය
- පර්යන්ත ස්නායු පද්ධතිය

04. ස්නායුක සමායෝජනය සිදුවන්නේ ස්නායු පද්ධතිය මගිනි.

ii. මධ්‍ය ස්නායු පද්ධතියට ආරක්ෂාව සැපයෙන ව්‍යුහ තුනක් සඳහන් කරන්න.

- අස්ථිමය ආවරණය (කපාලය/කශේරුව)
- මෙනින්ජී පටල
- මස්තිස්ක සුෂුම්නා තරලය

iii. මස්තිස්ක සුෂුම්නා තරලයේ ප්‍රධාන කාර්යයන් තුනක් සඳහන් කරන්න.

- කම්පන අවශෝෂණය
- පෝෂණය සැපයීම
- ක්ෂුද්‍ර ජීවී ආසාදනවලින් ආරක්ෂා කිරීම.

iv. රූප මගින් දැක්වෙන්නේ මධ්‍ය ස්නායු පද්ධතියට අයත් මොළය, සුෂුම්නාව සහ පර්යන්ත ස්නායු පද්ධතිය සිරුරේ ක්‍රියාකාරිත්වයට දක්වන සම්බන්ධතාවය යි.





v. මධ්‍ය ස්නායු පද්ධතියට අයත් පහත කොටස්වල කෘත්‍ය කෙටියෙන් පැහැදිලි කරන්න.

a. මස්තිෂ්කය



a. මස්තිෂ්කය



- මතකය බුද්ධිය වැනි උසස් මානසික ක්‍රියා පාලනය කිරීම
- සංවේදන හඳුනා ගැනීම.
- සිතා මතා සිදු කරන (ඉච්ඡානුග) පේශි චලන පාලනය කිරීම.

Smart Learning For Students by Chilaw Education Zone

b. අනුමස්තිෂ්කය



- දේහයේ සමතුලිතතාව පාලනය කරීම
- චලන සඳහා පේශි සමායෝජනය කිරීම.

c. සුෂුම්නා ශිර්ෂකය

- හෘද ස්පන්දන වේගය, ශ්වසන වේගය, වැනි සිතා මතා පාලනය නොකෙරන ක්‍රියා පාලනය කිරීම



d. සුෂුම්නාව

- දේහය හා මොළය අතර පනිවුඩ සම්ප්‍රේෂණය කිරීම



vi. පර්යන්ත ස්නායු පද්ධතියේ කෘත්‍ය කෙටියෙන් සඳහන් කරන්න.



- ප්‍රතිග්‍රාහකවල සිට මධ්‍ය ස්නායු පද්ධතිය වෙතට ආවේග සම්ප්‍රේෂණය කිරීම

- මධ්‍ය ස්නායු පද්ධතියේ සිට කාරක වෙතට ආවේග සම්ප්‍රේෂණය කිරීම

vii. මිනිස් සිරුරේ ස්නායු ආවේග ගමන් කරන වේගය අධ්‍යයනය සඳහා සුදුසු ක්‍රියාකාරකමක් පියවර තුනකින් ලියන්න.

- ✓ 30 cm කෝදුවක් ගෙන ශූන්‍ය පොළොව දෙසට යොමුවන සේ හරවා තවත් සිසුවෙකු ගේ අතෙහි ස්පර්ශ වන නොවන සේ තබා අතහරින්න.
- ✓ අතහරින මොහොත නිරීක්ෂණය කරමින් කෝදුව අල්ලා ගැනීමට උපදෙස් දෙන්න.
- ✓ විවිධ සිසුන් සඳහා ක්‍රියාකාරකම සිදු කරන්න.

➢ *පෙළ පොත ක්‍රියාකාරකම 9.3 බලන්න.*

Smart Learning For Students by Chilaw Education Zone

vii. ස්නායු පද්ධතියේ ආරක්ෂාව සඳහා ඔබට ගත හැකි ක්‍රියාමාර්ග පහක් සඳහන් කරන්න.

- කුඩා කාලයේ සිටම සමබල ආහාර වේලක් ගැනීම.
- අධික ලෙස නිදි වැරීමෙන් වැළකීම.
- ක්‍රීඩා හා ව්‍යායාම කිරීමේ දී නිවැරදි ඉරියව් පවත්වා ගැනීම.
- බර එසවීමේ දී නිවැරදි ඉරියව් තබා ගැනීම.
- මානසික ආතතිය වැනි තත්ත්ව පාලනය කර ගැනීම.

මානව සම


Melanocytes
Keratinocytes
Nerve endings
Fibroblasts
Epidermis
Sebaceous gland
Vein
Artery
Dermis
Arrector pili muscle
Sweat gland
Hair follicle
Hypodermis

05. මිනිස් සිරුරේ විශාලතම ඉන්ද්‍රිය වන සම ප්‍රධාන කෘත්‍යය කිහිපයක් ඉටු කරයි. සමෙහි ව්‍යුහය දැක්වෙන රූපසටහනක් පහත දැක්වේ

i. රූපයේ A,B,C,D,E,F,G,H අක්ෂර මගින් නිරූපනය කරන කොටස් නම් කරන්න.



ii. පහත තොරතුරුවලට අදාළ සමෙහි කොටස කුමක්දැයි වගුවේ දක්වන්න.



	තොරතුර	අදාළ වන සමෙහි කොටස
a	සමෙහි බාහිරින්ම ඇති කොටස වේ.	අපිචර්මය
b	අපිචර්මයට පහළින් පිහිටයි	චර්මය
c	චර්මයට ඇතුලතින් පිහිටයි	අධශ්චර්මය
d	සජීවී සහ අජීවී සෛල සහිතයි	
e	මෙලනින් නමැති වර්ණකය ඇත.	
f	ස්වේද ග්‍රන්ථි සහ ස්නේහස්‍රාවී ග්‍රන්ථි පිහිටයි.	
g	ස්නායු අන්ත සහ රුධිර කේශනාලිකා ඇත.	

Smart Learning For Students by Chlaw Education Zone

ii. පහත තොරතුරුවලට අදාළ සමෙහි කොටස කුමක්දැයි වගුවේ දක්වන්න.



	තොරතුර	අදාළ වන සමෙහි කොටස
a	සමෙහි බාහිරින්ම ඇති කොටස වේ.	අපිචර්මය
b	අපිචර්මයට පහළින් පිහිටයි	චර්මය
c	චර්මයට ඇතුලතින් පිහිටයි	අධශ්චර්මය
d	සජීවී සහ අජීවී සෛල සහිතයි	අපිචර්මය
e	මෙලනින් නමැති වර්ණකය ඇත.	
f	ස්වේද ග්‍රන්ථි සහ ස්නේහස්‍රාවී ග්‍රන්ථි පිහිටයි.	
g	ස්නායු අන්ත සහ රුධිර කේශනාලිකා ඇත.	

ii. පහත තොරතුරුවලට අදාළ සමෙහි කොටස කුමක්දැයි වගුවේ දක්වන්න.



	තොරතුර	අදාළ වන සමෙහි කොටස
a	සමෙහි බාහිරින්ම ඇති කොටස වේ.	අපිචර්මය
b	අපිචර්මයට පහළින් පිහිටයි	චර්මය
c	චර්මයට ඇතුලතින් පිහිටයි	අධශ්චර්මය
d	සජීවී සහ අජීවී සෛල සහිතයි	අපිචර්මය
e	මෙලනින් නමැති වර්ණකය ඇත.	අපිචර්මය
f	ස්වේද ග්‍රන්ථි සහ ස්නේහස්‍රාවී ග්‍රන්ථි පිහිටයි.	චර්මය
g	ස්නායු අන්ත සහ රුධිර කේශනාලිකා ඇත.	

Smart Learning For Students by Cimaw Education Zone

ii. පහත තොරතුරුවලට අදාළ සමෙහි කොටස කුමක්දැයි වගුවේ දක්වන්න.



	තොරතුර	අදාළ වන සමෙහි කොටස
a	සමෙහි බාහිරින්ම ඇති කොටස වේ.	අපිචර්මය
b	අපිචර්මයට පහළින් පිහිටයි	චර්මය
c	චර්මයට ඇතුලතින් පිහිටයි	අධශ්චර්මය
d	සජීවී සහ අජීවී සෛල සහිතයි	අපිචර්මය
e	මෙලනින් නමැති වර්ණකය ඇත.	අපිචර්මය
f	ස්වේද ග්‍රන්ථි සහ ස්නේහස්‍රාවී ග්‍රන්ථි පිහිටයි.	චර්මය
g	ස්නායු අන්ත සහ රුධිර කේශනාලිකා ඇත.	චර්මය

Smart Learning for Students by Chilaw Education Zone



d. සම මගින් ඉටු කෙරෙන කෘත්‍ය කිහිපයක් පහත දැක්වේ. එම කෘත්‍යයන්ට අදාළ ව සමෙහි ඇති අනුවර්තනය ලියන්න.

a. ආරක්ෂක ආවරණයක් ලෙස ක්‍රියා කිරීම:

- දේහයෙන් ජලය පිටවී යාම වැළැක්වීම :
  - අපිචර්මයේ බාහිරින් සෛල ස්ථරයක් පිහිටීම.
- දේහය පාර ජම්බුල කිරණවලින් ආරක්ෂා කිරීම :
  - සමෙහි සෛල තුළ මෙලනින් වර්ණකය පිහිටීම.
- ක්ෂුද්‍ර ජීවීන්ගෙන් සම ආරක්ෂා කිරීම :
  - ස්නේහස්‍රාවී ග්‍රන්ථි වලින් ආරක්ෂක ශ්‍රාවයක් නිකුත් කිරීම.

b. දේහ උෂ්ණත්වය පාලනය කිරීමට දායක වීම :

- බාහිර පරිසරයේ උෂ්ණත්වය වැඩිවූ විට සිරුරෙහි උෂ්ණත්වය වැඩිවීම වැළැක්වීම :
  - **ස්වේද ග්‍රන්ථි මගින් දහදිය ශ්‍රාවය කිරීම.**

- බාහිර පරිසරයේ උෂ්ණත්වය අඩුවූ විට සිරුරෙහි උෂ්ණත්වය අඩුවීම වැළැක්වීම :
  - **රුධිර කේශනාළිකා හරහා සම මතුපිටට රුධිරය පැමිණීම අඩු කිරීම හා ස්වේදය නිපදවීම අඩු කිරීම.**

Smart Learning For Students by Chilaw Education Zone

c. සංවේදී අවයවයක් ලෙස ක්‍රියා කිරීම :

➢ *උත්තේජ ප්‍රතිග්‍රහණය කිරීම :*

- පීඩනය, ස්පර්ශය සහ උෂ්ණත්වය වැනි උත්තේජ ප්‍රතිග්‍රහණය කළ හැකි ස්නායු අන්ත චර්මයෙහි පිහිටා තිබීම.

d. විටමින් නිෂ්පාදනය :

➢ විටමින් D නිෂ්පාදනය :

- හිරු එළියෙහි අඩංගු පාරජම්බුල කිරණ මගින් සමහේ සෛල තුළ විටමින් D නිපදවීමට ඇති හැකියාව.

e. බහිස්ස්‍රාවීය ද්‍රව්‍ය බැහැර කිරීම :

- යූරියා, යූරික් අම්ලය , ඇමෝනියම් ලවණ බැහැර කිරීම.

- **ස්වේද ග්‍රන්ථි මගින් ස්වේදය නිපදවීම.**

iv. සමෙහි නිරෝගී බව ආරක්ෂා කර ගැනීමට අනුගමනය කළ යුතු පිළිවෙත් අටක් ලියන්න.

- පෝෂයදායී ආහාර ලබා ගැනීම.
- සම පිරිසිදු කිරීමේ දී නිසි පිළිවෙත් අනුගමනය කිරීම.
- හිරු රශ්මියෙන් සම ආරක්ෂා කර ගැනීම.
- දුම්පානය නොකිරීම සහ දුම්පානය කරන්නන් අසල නොගැවසීම
- කපු රෙදිවලින් සකසන ලද ඇඳුම් පැලඳුම් භාවිත කිරීම.
- වෙනත් පුද්ගලයන් සමග ඇඳුම් පැලඳුම් හුවමාරු කර භාවිත නොකිරීම.

Smart Learning For Students by Chilaw Education Zone

- කුරුළෑ සහ ඉන්නන් වැනි සමේ රෝග සඳහා වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම.
- යහපත් මානසික තත්ත්වයක් පවත්වා ගැනීමට කටයුතු කිරීම.

ඔව්, දැන් මට පුළුවන් ! Yes , I Can !

- බහිස්‍රාවය යන්නෙන් අදහස් වන දේ පැහැදිලි කිරීමට
- මානව බහිස්‍රාවීය ඉන්ද්‍රිය සහ බහිස්‍රාවී ඵල නම් කිරීමට
- මානව මූත්‍ර පද්ධතියේ රූප සටහනක් ඇඳ කොටස් නම් කිරීමට
- වෘක්කවල පිහිටීම හා අභ්‍යන්තර ව්‍යුහය සරලව විස්තර කිරීමට
- වෘක්ක ආශ්‍රිත රෝගාබාධ ඇතිවීමට හේතු වන කරුණු සඳහන් කිරීමට
- වෘක්ක ආශ්‍රිත රෝගාබාධ වළක්වා ගැනීමට ගත හැකි පියවර සඳහන් කිරීමට
- සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් පවත්වා ගැනීමේ වැදගත්කම පිළිගැනීමට
- සමායෝජනය යනු කුමක්දැයි විස්තර කිරීමට
- සංවේදක ඉන්ද්‍රිය සහ කාරක පිළිබඳ සරල විස්තරයක් ඉදිරිපත් කිරීමට

- මධ්‍ය ස්නායු පද්ධතියේ ප්‍රධාන කොටස් සඳහන් කිරීමට
- ස්නායු ආවේගයක ස්වභාවය ආදර්ශනය සඳහා සරල ක්‍රියාකාරකම් සිදු කිරීමට
- ස්නායු පද්ධතියේ යහපැවැත්මට අනුගමනය කළ යුතු පිළිවෙත් සඳහන් කිරීමට
- මානව චර්මයේ ප්‍රධාන කොටස් හා කෘත්‍ය පැහැදිලි කිරීමට
- සමෙහි දළ සටහනක් ඇඳ කොටස් නම් කිරීමට
- නිරෝගී සමක් පවත්වා ගැනීමේ වැදගත්කම පිළිගැනීමට
- සමෙහි නිරෝගී බව ආරක්ෂා කර ගැනීමට පිළිපැදිය යුතු පිළිවෙත් සඳහන් කිරීමට

මානව ඉන්ද්‍රිය පද්ධති

Yes! I Can



ස්තූතියි !

සැකසුම:
එල්.ගාමිණි ජයසූරිය මයා
ගුරු උපදේශක(විද්‍යාව)
වෙන්/කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය
ලුණුවිල